# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1560/28 - 2008 අගෝස්තු 01 වැනි සිකුරාදා - 2008.08.01

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාතේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය

**7 (1) වගන්තිය යටතේ නියෝගය**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 7 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන, ප්‍රවාහන, රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජයවර්ණසූරිය වන මම, එකී වගන්තිය යටතේ සාදා 1990.11.20 වැනි දින සහ අංක 637/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද,එකී වගන්තිය යටතේ සාදා 2008 ජුනි 11 වැනි දින සහ අංක 1553/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගයෙන් අවසන් වරට සංශෝධනය කරන ලද්දා වූ ද, නියෝගය 2008.07.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ලෙස සංශෝධනය කරමි.

1. එම නියෝගයේ (ඹ), (ඕ), (ක) උප ඡේද ඉවත් කොට, (ඒ) උප ඡේදයෙන් ඉක්බිතිව ,"ඹ" අක්ෂරය යටතේ පහත සඳහන් උප ඡේදය ආදේශ කිරීම.

(ඹ) ඉහත (අ), (ආ), (ඉ), (ඊ), (ඌ), (එ), (ඒ) යටතේ සඳහන් යම් ව්‍යාපාරයක් හැර යම් ද්‍රව්‍යයක් හෝ වෙළඳ ද්‍රව්‍යයන් විකිණීමේ හෝ මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් හා (උ) උප ඡේදයේ සඳහන් යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් විකිණීමේ හෝ මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් — සියයට 01

පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජයවර්ණසූරිය,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන, ප්‍රවාහන,
රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය.

2008 ජූලි මස 30 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය (බ.ප.),
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07.

08-582

1A - PG 000927— 440 (2008/08)　ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.